අනුරත් ඔහුට පෙන්නුවා ය.

"ඇයි යාලුවො එක්ක ඉන්නෙ නැතිව මෙතනට වෙලා ඉන්නෙ...?" ඔහු ඇසුවේ ය. ඇය සුපුරුදු ලෙස පිළිතුරක් නොදී බලා සිටියා ය.

ඈත කඳු පේළියේ තැනින් තැන විදුලි පහන් දැල්වී ඇති අයුරු නිෂාධිට කවුළුව තුළින් පෙනෙයි. අඳුර වැටෙත්ම මුළු නුවරඑළියම නිද්‍රාවට වැටී ඇති සේ ය. තමා ඉදිරියේ වාඩි වී සිටිනා ප්‍රසන්න තරුණයා සමග තොර තෝංචියක් නැතිව කතා කරන්නට තරම් සිතක් ඈය තුළ විය. ඒ කැමැත්ත පිටතට නොපෙන්වා සිටිය යුතු වන්නේ කුමක් නිසා දැයි ඇයට නොවැටහෙයි.

"එක්කෝ කතා කරන්න ඕනෙ... නැත්නම් කන්න ඕනෙ.. එහෙමත් නැත්නම් කෑම එක අත ගගා ඉන්නෙ නැතිව ගිහින් අත සෝදාගෙන එන්න ඕනෙ..."
අනුරාධ බොහෝ වේලාවකට පසුව කීවේ ය.

"සොරි..." ඈ පිඟානද රැගෙන නැගී සිටියා ය. .
"තරහ ගියා ද?.". ඔහු ඇසුවේ ය.

නිෂාධි පිළිතුරක් නොදුන්නා ය. තමාට පිටුපා යන නිෂාධි දෙස අනුරාධ හැරී බැලුවේ ය.

"මිස්ට කෝල් එකක්.. ඔස්ට්‍රේලියා-වෙන්...." සඳමාලි කියනු අනුරාධට ද පැහැදිලිව ඇසුණි. නිෂාධි දුරකථනය අතැතිව අනුරාධ දෙස හැරී බැලුවා ය. දුරකථන ඇමතුම දිලීප ගෙන් බවට සැකයක් නැත. අනුරාධ ඉදිරියේ දිලීප සමග කතා කරන්නට අපහසුවක් ඇයට දැනුණි. ඇය ඔහු දෙස බැලුවේ ඉවත්ව යන්නට අවසර පතන බැල්මක් රැඳුණු දෑසිනි. ඔහු හිස සළා ඇයට අනුමැතිය දුන්නේ ය.

"ඇයි මොබයිල් එක ඕෆ් කරගෙන ඉන්නෙ...?" රිසිවරය තුළින් ඇසුණ දිලීපගේ කටහඬෙහි රැඳුන අප්‍රසාදය ඈ වහා වටහා ගත්තා ය.
"බැට්රි බැහැලා..." නිෂාධි කීවාය.

"බැට්රි බැහැලා..?" ඔහු එයම ප්‍රශ්ණයක් ලෙස ඇසුවේ ය.

"ඔව්.. ආව දා ඉඳලම ඔයා කෙයි වෙලේ හරි කෝල් එකක් දෙයි කියලා ඔන් එකේමනෙ තිබුණෙ.. ඔයාට කෝල් එකක් දෙන්න මතක් වෙනකොට ෆෝන් එකේ බැට්රියත් බැහැලා.."
"එහෙමනං දැන්වත් චාජ් කරන්න.... "

"හොඳයි.." ඈ උපහාසයෙන් කීවා ය. ..
"සුමාන දෙකකට පස්සෙ කතා කරනකොට ෆෝන් එක ගැන ඇරෙන්න අහන්න වෙන කිසිම දෙයක් නැද්ද ඔයාට..?"

ඔහු සිනාසෙනු ඇයට ඇසුණි.

"තරහ ගියා ද..?" ඔහු නිවුණ හඬකින් ඇසුවේ ය. මොහොතකට පෙර මේ ප්‍රශ්නයම අනුරාධ ද ඇසූ බව ඇයට සිහි විය.
ඈ නිහඬවම අසා සිටියා ය.
"මට පාලුවක් දැනෙනවා නිෂා....සමහර වෙලාවට ළඟ පාතක තියෙන දේක අගේ දැනෙන්නෙ ඒක ටිකක් ඈත් වුණාම යි..." ඔහු කීවේ ය.

"ඒක සඳහටම නැති වුණා ම අගේ තවත් වැඩියෙන් දැනේ වි.." ඈ කීවා ය.
"මං ඔයාව ලංකාවට එව්වෙ කැමැත්තෙන් නෙවෙයි.. "

නිෂාධි උපහාසයෙන් සිනාසුණා ය. තව දුරටත් කතා කරන්නට දෙයක් නැති සෙයක් ඇයට දැනුණි. ඔහු තව මොන මොනවාදෝ කියනු ඇයට ඇසුණි. ඒ කෙරෙහි අවධානයක් යොදන්නට ඇයට අවශ්‍යතාවක් නොවි ය. ඈ හැරී අනුරාධ දෙස බැලුවා ය. ඈත ශාලාවේ කෙළවරක සිට ඔහු තවමත් තමා දෙස බලා සිටිනු ඇයට පෙනෙයි.

"මට නිදිමතයි දිලීප... හෙට කතා කරන්න..." නිෂාධි කීවා ය. ඔහු පිළිතුරක් දෙන්නට පෙරම ඇය දුරකථනය විසන්ධි කළා ය.

ආපසු හැරී අනුරාධ වාඩිව සිටින මේසය වෙත යන්නට සිතක් නිෂාධීට නොවී ය. අනුරාධගෙන් හෝ යහළුවන්ගෙන් හෝ සමු නොගෙනම ඇය සිය කාමරය වෙත ගියා ය. වෙහෙස නිසා ඉක්මනින් නින්ද යනු ඇතැයි සිතා සිටියද ඒ රාත්‍රිය නිෂාධි ට ඉතා දිග රැයක් විය. රාත්‍රිය පුරා සිරිපොද වැස්සක් ඇද හැළෙණු ඇය අසා සිටියා ය. කාලාන්තරයක් මුළුල්ලේ දිලීප කෙරෙහි සිය



සිතේ ගොඩ නැගෙමින් පවතින අප්‍රසාදය වෙන කිසිම දාකට වඩා දැනෙන බවක් ඇයට හැඟුණි. දිලීප විසින් ගොඩ නගමින් පවතින කෘත්‍රිම සුරලෝකය තුළ තව කොපමණ කාලයක් ජීවත් විය හැකි ද යන්න ඇය මුළු රාත්‍රිය පුරාම කල්පනා කළ එකම පැනයයි.

"මහපොළොවේ පය ගහලා ජීවත් වෙන්න ඔයා දන්නෙ නැහැ දිලීප.." ඇය මිමිණුවා ය.

00000000

නිෂාධි ඇහැරුණේ උදෑසන දහයටත් පසුවය. පවිත්‍රා කාමරයේ දොරට තට්ටු කරන විටත් ඇය සිටියේ ඇඳේ ඇලවී ගත්වනම ය.

"මොකද රෑ අපටත් නොකියා ම කාමරේට ආවෙ..? දිලීපගෙන් නේද කෝල් එක.. ?"
"මොකද දෙන්න ඇරගත්ත ද?" පවිත්‍රා කාමරයට ඇතුල් වූයේ ප්‍රශ්න වැලක් ද රැගෙන ය.
"දැන් මං ඉස් ඉස්සෙල්ලම උත්තර දෙන්න ඕනෙ කොයි එකට ද?" නිෂාධි ඇඳ මත වාඩි වී කොට්ටයක් උකුල මත තබා ගත්තා ය.
"කැමති එකකට.."

"එක... කතා කළේ දිලීප.. දෙක.....ඇරගන්න තරම් අමුතු දෙයක් අලුතෙන් වුණේ නැහැ.. තුන... කියන්නෙම නැතුව ආවෙ හිතේ සතුටක් නොතිබුණ නිසයි.. නොකියා ආව එක ගැන සමාවෙයං..."

"ප්‍රශ්නයක් නැහැ.. මං ගෙස් කළා මොකක් හරි දෙයක් තමයි කියලා.. " පවිත්‍රා ඇඳේ පසෙකින් වාඩි වූවා ය. ".. ඉතින් ඇඳගනින් .. අපි දැන් එළියට යනවා.."

"කොහෙද යන්නෙ..?"

"අපි යනවා අද ෆිල්ම් එකක් ෂූට් කරන හැටි බලන්න..."

"මොකක්..?"

"ෆිල්ම් එකක් ෂූට් කරනවා බලන්න... අපිට ඊයෙ අනුරාධ ඉන්වයිට් කළා..."



"අනුරාධ....?"
"ඔව් අනුරාධ තමයි... මොකද නිකං නොදන්නව වගේ කතා කරන්නෙ...... උඹටත් කියන්න ඇති නෙ.. අපි බලාගෙන හිටියෙ දෙන්නගෙ කතාව..."

"පිස්සු... මං එන්නෙ නෑ... උඹලට ඕනෙ නම් පලයල්ලා.." නිෂාධි ඇඳේ ඇලවී පොරෝනය පොරවා ගත්තා ය. ".. යනකොට දොර වහගෙන පලයන්.."

"මේ බොරු පාට් දාන්න එපා... පිස්සු නටන්නෙ නැතිව ඇඳගෙන වරෙන්.. "

"මං එන්නේ නෑ... ඒන්නෑ කිව්වම එන්නේ නෑ..අද දවසෙම නිදාගන්නයි හිතා ඉන්නෙ.. ඔන්න මං නිදා ගත්තා.." නිෂාධි කොට්ටයකින් හිස වසා ගත්තා ය.

"පිස්සි..." පවිත්‍රා කියනු ඇයට ඇසුණි.

පවිත්‍රා පිටව ගිය පසුද නිෂාධි බොහෝ වේලාවක් හිටි ඉරියව්වෙන්ම ඇඳේ ඇලවී සිටියා ය. ඇය ඇඳෙන් නැගිට්ටේ තේ කෝප්පයක් බීමේ අවශ්‍යතාව සිතට දැනුණ පසුව ය. නාන කාමරයට වැදී මුහුණ සෝදාගත් නිෂාධි අලුත් ඇඳුමකින් සැරසී පහත මාලයට ආවා ය.

"ගුඩ් මෝනිං මිස්... පිළිතැනීමේ කවුන්ටරයේ සිටි සඳමාලි සිනා සී කීවා ය. ".. යුද්ධයක් ඉවර වුණා වගේ.. .. ෆිල්ම් කට්ටිය ඔක්කොම උදෙන්ම පිටත් වෙලා ගියා... "

*<u>අනුරාධ කඳුබෑවුම අසළ නැවතුණේ ය. මෙතැනට පහත නිම්නය හොඳින් පෙනෙයි. දහවල ඉර එළිය තැනින් තැන පතිතිව තිබෙයි. ඈත ගොව්බිම් කොළ පළසක් සේ මෙතැනට පෙනෙයි.</u>*

"ඔයාලගෙ කුමාරත් ගියා ද..?"
"අනේ පව් මිස්.. මැනේජර් නිවාඩු දෙන්න බැහැයි කිව්වනෙ.. "
"අනේ පව්.. කෝ දැන් "
"අන්න අරහෙ නාහෙං අඬ අඬා ඉන්නවා... පිස්සා.. ඔය එන්නෙ..."

කුමාරගේ මැළවුණ මුහුණ දුටු නිෂාධිට දුක සිතිණි. මේ තරුණයා ඊයේ කොයි තරම් ප්‍රබෝධයකින් සිටියේ ද?

"මොකද කුමාර වුණේ...?" නිෂාධි ඇසුවාය.

"මොනා වෙන්නද මිස්.. මට නිවාඩු දෙන්න බැහැයි කිව්වා.." කුමාර කතා කරන්නේ හඬන්නාක් මෙනි. "....අපරාදෙ අතටම ආව චාන්ස් එක.. ආයෙනම් ඉතින් මේ වගේ චාන්ස් එකක් එන්නෙ නැහැ මිස්.."

නිෂාධි මොහොතක් කල්පනා කළා ය. රඟපෑමේ උන්මාදයකින් පෙළෙන මේ තරුණයාට උපකාරයක් කළ යුතු යැයි ඇය සිතුවා ය.

"කුමාර ඔහොම පොඩ්ඩක් ඉන්න.. මං මැනේජර් මහත්තයා හමුවෙලා එන්නම්.".

නිෂාධි කළමණාකරුගේ කාමරයේ සිට නැවත ආවේ අපූරු සිනාවකින් මුව සරසාගෙන ය.

"යමු කුමාර.. මැනේජර් මහත්තායා හයරිං කාර් එකකුත් ලෑසිති කරලා දෙන්නම් කිව්වා... "

"මිස් මොකක්ද කිව්වෙ...?" කුමාර අසන්නේ කුතුහලය නිසා ය.

"මට හදිස්සියකට බදුල්ලට යන්න ඕනෙ කිව්වා.. මගේ තනියට කුමාරව එක්කගෙන යන්න පර්මිෂන් ගත්තා.. ඉතින් යමු යමු.."

000000033

අනුරාධ සිටියේ කැළඹුන සිතකිණි. අනුරත් පවිත්‍රාත් පැමිණ පැයක් පමණ රූප ගත කිරීම් දෙස බලා සිටි නමුත් නිෂාධිගේ නොපැමිණීම ඔහුගේ සිතේ කණගාටුවක් ඇති කරන්නට සමත් වී තිබුණි. චරිතය කෙරෙහි නිසියාකාරව සිත යොමන්නටත් දෙබස් මතක තබාගන්නටත් එකලාසයකි ඔහුගේ සිතේ නොවී ය. දවසේ පළමු ජවනිකා දෙකම නිසියාකාරව රඟපා-න්නට ඔහුට නොහැකි වූයේ එනිසා ය.

"මට අද සනීප නැහැ වගේ.. concentrate කරන්න බැහැ......" අනුරත් පවිත්‍රාත් සමුගන්නට සැරසුණ මොහොතේ අනුරාධ කීවේ තමාගේ කැළඹීම ඔවුනට තේරුම් ගියේ ද යන සැකය නිසා ය.

සියල්ලට පළමුව හිත එකළස් කර ගත යුතු ය. අනුරාධ අධ්‍යක්ෂකවරයාගෙන් අවසර ගෙන දර්ශන තලයෙන් ඉවතට ගියේ ය. කුඩා උද්‍යානය මැදින් වැටී තිබූ පටු මාර්ගයේ අරමුණකින් තොරව ඉදිරියට ගිය අනුරාධ කඳුබෑවුම අසළ නැවතුණේ ය. මෙතැනට පහත නිම්නය හොඳින් පෙනෙයි. දහවල ඉර එළිය තැනින් තැන පතිතිව තිබෙයි. ඈත ගොව්බිම් කොළ පළසක් සේ මෙතැනට පෙනෙයි. මේ සුන්දරත්වට ඇසට සේ ම සිතටද සහනයකි.

මේ තරම් සිත කැළඹුණ දිනක් අනුරාධට සිහිපත් කරගත නොහැකි ය. අහම්බයකින් හමුවූ නන්නාඳුනනා තරුණියකට මේ තරම් දෙයක් කරන්නට හැකිවීමම පුදුමයක් නොවේ ද? ඊයේ රාත්‍රියේ සමුනොගනෙම ඉවත්ව ගිය ද අද නිසැකවම නිෂාධි මෙහි එනු ඇතැයි අනුරාධ විශ්වාස කළේ ය. උදෑසන දර්ශණ තලයට ඔහු ආවේ ඒ සිතිවිල්ල නිසා හටගත් ප්‍රබෝධයෙන් සි.ත පුරවාගෙන ය. ඇය හිතාමතාම තමා මගහැරියාද?

මේ සියල්ල මායාවක් නොවේ ද? යළි කිසි දිනෙක ඇය හමු නොවනු ඇතැයි ඔහුට සිතෙයි. ඇය හෙට හෝ අනිද්දා නැවත කොළඹ යනු ඇත. ඉන්පසු දිනෙක ඔස්ට්‍රේලියාව බලා යනු ඇත. ඉන්පසු මේ සියල්ල සිහිනයක් සේ මතකයෙන් ඈත්ව නොයනු ඇති ද?

අනුරාධ සුසුමක් හෙළුවේය. ආපසු රූ ගත කරන තැනට නොයා හෝටලයට යා යුතු යයි ඔහුට සිතුණි.

"සර්..... මං ආවා....."

අනුරාධ හැරී බැළුවේ ය. අඩි පාරේ ඈත සිට දුවමින් එන කුමාර ඔහු දුටුවේ ය. කුමාරට බොහෝ පසු පසින් අඩිපාරේ ඈත කෙළවරක නිෂාධි සිටගෙන සිටියා ය.

නිෂාධි... අනුරාධ තොල්මැතිරුවේ ය.

අනුරාධ ඇය වෙත යන්නට සිතන මො-හොතේම ඈ ආපසු හැරුණා ය.

**ළබන කළාපයට**